(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 166.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2017 මැයි මස 23 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

855/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, 181F කැටගෙවත්ත ග්‍රාම නිලධාරි වසමෙහි, ඉහළගම ග්‍රාමයෙහි පිහිටා තිබෙන පොල්ගහ වැව (ඉහළගම) නිසි ලෙස නඩත්තු නොකිරීම හේතුවෙන් විනාශ වීමේ අවදානමක් ඇති බවත්;

(ii) ඇතැම් සංවිධානාත්මක පිරිස් වැව ගොඩ කිරීමට හා වැවට අයත් රක්ෂිත ඉඩම් අත්කර ගැනීමට කටයුතු කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහළගම වැව ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2016 අයවැයෙන් මුදල් වෙන්කර තිබුනේද;

(iv) එසේ නම්, එම ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) නීතිවිරෝධී ලෙස වැව ගොඩ කිරීම හා වැවට අයත් ඉඩම් අත්කර ගැනීම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම නීතිවිරෝධී ක්‍රියාවන්ට දායකවූ පිරිසගේ නම් කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ගත් ක්‍රියාමාර්ග කවරේද;

(iv) වැවේ ඇතැම් ස්ථාන ගොඩකර කොහිල වගා කර ඇති ප්‍රදේශ නැවත අත්කර ගැනීමට කටයුතු කරන්නේද;

(v) එලෙස කොහිල වගා කළ අයට විරුද්ධව ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1007/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කතරගම පූජා නගරයේ, ආරක්ෂක කලාපය තුළ පවතින 'ඔසු උයන' නමින් හඳුන්වන ඉඩමේ අක්කර තිහක පමණ කොටසක්, යුද හමුදාව ද යොදා ගෙන ඖෂධ පැලෑටි විනාශ කරමින් 2016 ජූලි මාසයේදී එළි පෙහෙළි කළ බවත්;

(ii) ඊට එරෙහිව මහා සංඝරත්නය සහ ප්‍රදේශයේ ජනතාව විරෝධය පළ කළ බවත්;

(iii) අංක එස්ඊ්අයි/289/465 දරන 1990.01.30 දිනැති ලිපිය මඟින් ජනාධිපතිවරයා විසින් එකී ඉඩම ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට පවරා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් විනාශයට වගකිවයුත්තන් කවුරුන්ද;

(ii) ඔවුන්ට එරෙහිව ගෙන ඇති පියවර කවරේද;

(iii) එකී විනාශය සිදු කළේ එම ස්ථානයේ ඉන්දියාවේ තිරුපති දේවාලයේ ශාඛාවක් ඉදිකිරීමටද;

(iv) ඉහත (iii) හි සඳහන් ඉදිකිරීමට අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක අනුමතිය හිමි වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1102/'16

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මඩකලපුව, නාවට්කර්නි කන්නකි විද්‍යාලයේ ගුරුවරියක වන නලිනගාන්ධි විමලේන්ද්‍රන් මහත්මිය, 2008 දී මඩකලපුව ගුරු විදුහලෙන් සිය පුහුණුව අවසන් කළ බවත්, මුලතිව් දිස්ත්‍රික්කයේ කයිවෙලි ගනේෂා විද්‍යාලයට පත්කළ බවත්;

(ii) 2009 අප්‍රේල් මස පැවති මඩකලපුව ගුරු විදුහලේ අවසන් පරීක්ෂණයට පෙනී සිටින ලෙසට ඇයට දැනුම් දීමක් කෙරුණු බවත්;

(iii) එම කාලසීමාවේ දී යුද්ධය උච්චතම අවස්ථාවට එළඹ තිබූ බැවින් කිසිදු පුද්ගලයෙකුට මුලතිව්වලින් පිටවීමට අවසර නොතිබූ බවත්;

(iv) ඇය සිය කනිෂ්ඨ කණ්ඩායම සමඟ පරීක්ෂණයට පෙනී සිටි බවත්, ඇයගේ සහතිකයේ බලාත්මක දිනය 2011.01.01 වූ අතර ඇයගේ කනිෂ්ඨයන්ට එම දිනය 2009.08.01 වූ බවත්;

(v) ඇය මේ අසාධාරණය පිළිබඳව ජනාධිපතිතුමාට අභියාචනයක් ඉදිරිපත් කර ඇති බවත්, මෙම විෂමතාව නිවැරදි කිරීම සඳහා ජනාධිපතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා 2016.08.05 දිනැති අංක SL/EDU/APP/0043 දරන ලිපිය එවකට, අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා වෙත යොමු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඇගේ සහතිකයේ බලාත්මක දිනය 2009.08.01 ලෙස වෙනස් කිරීමට උපදෙස් ලබා දෙන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1128/'16

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බස්නාහිර පළාත් සභාවේ වර්තමාන ප්‍රධාන අමාත්‍යවරයා එම තනතුරට පත්වීමෙන් පසු සිදු කර ඇති විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) සංචාරය කළ රටවල් සහ එම සංචාර සඳහා වැය වූ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් රටවල සංචාරය කළ අරමුණු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එකී විදේශ සංචාරවලින් අපේක්ෂිත අරමුණු සම්බන්ධයෙන් ලබාගත් ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1132/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු ආයෝජන පෞද්ගලික සමාගමට උසස් අධ්‍යාපන ආයතනයක් ඇරඹීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අවසරය ලබාදී තිබේද;

(ii) එසේ නම්, ඒ කවර උපාධි ලබාදීම සඳහාද;

(iii) එම ආයතනය සමඟ ගිවිසුම්ගත වූ දිනය කවරේද;

(iv) එම ගිවිසුම සභාගත කරන්නේද;

(v) ශ්‍රී ලංකාව තුළ වෛද්‍ය උපාධිය සහ සෞඛ්‍ය විද්‍යා උපාධිය පිරිනැමීමට අනුමතිය ලබාදීමේදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ පූර්ව අවසරය ලබාගත යුතු බවට වන කොන්දේසිය, ඉහත කී සමාගම සපුරා තිබේද;

(vi) එසේ නම්, සෞඛ්‍ය අමාත්‍යාංශය එම අවසරය ලබාදුන් ලිපිය සභාගත කරන්නේද;

(vii) නොඑසේ නම්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ඇති වූ එකඟතාවය කඩ කරන ලද එම සමාගමට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1147/'16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කාත්තාන්තුඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවන ලද දිනය කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ පිටපතක් සභාගත කරන්නේද;

(iii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මඟින් ආවරණය වන සම්පූර්ණ භූමි ප්‍රමාණය කොපමණද;

(iv) එහි ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(v) එම ග්‍රාම නිලධාරි වසම්වල නිල අංක හා නාමයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවීමේදී නිල වශයෙන් සීමා නිර්ණය කිරීමක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එකී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ඇති ග්‍රාම නිලධාරි වසම් අතරින් කිසියම් වසමක/වසම්වල පරිපාලන කටයුතු හෝ මෙහෙයවීම් වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදුකරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ග්‍රාම නිලධාරි වසම්වල නාමය, නිල අංක ඇතුළු විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1255/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1983 වර්ෂය වනවිට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ පිහිටා තිබූ පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම පොලිස් ස්ථානයන්හි සේවය කරන ලද පොලිස් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් වර්ෂ 1983න් පසුව, 2009 වර්ෂයේ යුද්ධය අවසන් වනතෙක් වූ කාලය තුළ විනාශ කරන ලද පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iv) ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් මියගිය පොලිස් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(v) ඉහත (iii) හි සඳහන් විනාශ වූ දේපළ පිළිබඳ තක්සේරුවක් කර තිබේද;

(vi) ඉහත සියල්ලෙහිම පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1300/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉකුත් රජය විසින් රජයේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා සහනදායී පදනම මත යතුරුපැදි ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ බව දන්නේද;

(ii) ඒ යටතේ මාතර දිස්ත්‍රික්කයේ රාජ්‍ය නිලධාරීන්ට ලබා දෙන ලද යතුරුපැදි සංඛ්‍යාව, ඔවුන්ගේ වෘත්තිය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එක් යතුරුපැදියක් සඳහා අදාළ නිලධාරියාගේ මූල්‍ය දායකත්වය හා රජයේ දායකත්වය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දායකත්ව මුදල නැවත ගෙවනු ලබන බවත්, සියලු රාජ්‍ය සේවකයන්ට නොමිලේ යතුරුපැදි ලබා දෙන බවටත් වත්මන් රජය පොරොන්දු වූ බව දන්නේද;

(ii) නැවත ගෙවනු ලැබූ මුදල් හිමිකර ගත් රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2015 සහ 2016 වර්ෂයන්හි රජයේ පූර්ණ අනුග්‍රහය මත යතුරුපැදි හිමිකර ගත් රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) දිස්ත්‍රික්කයේ යතුරුපැදි ලබා ගැනීමට හිමිකම් ඇති ඉතිරි රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන්ට නොමිලේ යතුරුපැදි ලබා දෙන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1375/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 129ට අනුව, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ මනා සහයෝගීතාවය දිරිගැන්වීම සඳහා රුපියල් මිලියන 1000 ක් වෙන් කළ බව පිළිගන්නේද;

(ii) කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වෙන් කරනු ලැබූ එකී රුපියල් මිලියන 1000 උපයෝජනය කළ ආකාරය කවරේද;

(iii) අයවැය යෝජනා මඟින් වෙන් කළ එකී රුපියල් මිලියන 1000 ක මූල්‍ය සම්පත්වල ප්‍රතිලාභීන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1538/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාත් සභාව යටතේ පාලනය වන පාසල් සඳහා වත්මන් ප්‍රධාන අමාත්‍යවරයා එම ධුරයට පත්වීමෙන් අනතුරුව, මේ දක්වා ලබාදී ඇති ගුරු පත්වීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ පත්වීම් ලබා දුන් අයගේ නම්, ලිපිනයන් හා ඔවුන් අනුයුක්ත කළ පාසල්වල නම් කවරේද;

(iii) එම ගුරු පත්වීම් ලබාදීමට අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1558/'17

ගරු කනක හේරත් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වර්ෂය තුළදී සබරගමුව පළාතේ, ජාතික පාසල් ගුරුවරුන්ට ආපදා ණය ගෙවීම සඳහා වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන කොපමණද;

(ii) එම සම්පූර්ණ මුදලම අදාළ වර්ෂයේදී පළාත් සභාවට ලබා දී තිබේද;

(iii) කෑගල්ල දිස්ත්‍රික්කයට වෙන් කළ ප්‍රතිපාදන කෑගල්ල, මාවනැල්ල, සහ දෙහිඕවිට අධ්‍යාපන කලාපවලට ලබාදුන්නේද;

(iv) එසේ නම්, එක් එක් කලාපයට ලබා දුන් මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) කෑගල්ල, මාවනැල්ල සහ දෙහිඕවිට කලාපයන්හි,

(i) ආපදා ණය ඉල්ලුම් කර ඇති ජාතික පාසැල් ගුරුවරුන් සංඛ්‍යාව;

(ii) ආපදා ණය ගෙවා ඇති ගුරුවරුන් සංඛ්‍යාව;

(iii) ගෙවා ඇති ණය මුදල්වල වටිනාකම;

එක් එක් අධ්‍යාපන කලාපය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉල්ලුම් කරනු ලැබුවද ආපදා ණය නොලැබුණු ගුරුවරුන්ට එම ණය මුදල ගෙවීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා කාර්යාලවලට අග්‍රිම නිදහස් කරන්නේද;

(iii) එසේ නම් , එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

856/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස, ගොඩපිටිය ජාතික පාසලට 2016 වර්ෂය සඳහා 6 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේදී අක්‍රමිකතාවයක් සිදුවී ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් සිසුන් පිරිසකට අසාධාරණයක් සිදු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගොඩපිටිය ජාතික පාසලට 2016 වර්ෂය සඳහා වෙනත් පාසල්වලින් 6 ශ්‍රේණියට ඇතුළත් කරගත් ශිෂ්‍යයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ශිෂ්‍යයන් ඇතුළත් කර ගත් ක්‍රමවේදය, එක් එක් ශිෂ්‍යයා අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) තෝරාගත් සිසුන් පිළිබඳ ලේඛනයක් විදුහල්පතිවරයා විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබේද;

(iv) එසේ නම්, එම ලේඛනයට අමාත්‍යාංශයේ නිර්දේශය ලබාදී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මේ පිළිබඳව පරීක්ෂණයක් සිදු කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) අසාධාරණයට ලක් වූ සිසුන් සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1256/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1983 වර්ෂය වනවිට පුත්තලම දිස්ත්‍රික්කය තුළ පිහිටා තිබූ පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම පොලිස් ස්ථානයන්හි සේවය කරන ලද පොලිස් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් වර්ෂ 1983න් පසුව 2009 වර්ෂයේ යුද්ධය අවසන් වනතෙක් වූ කාලය තුළදී විනාශ කරන ලද පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iv) ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් මියගිය පොලිස් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(v) ඉහත (iii) හි සඳහන් විනාශ වූ දේපළ පිළිබඳ තක්සේරුවක් කර තිබේද;

(vi) ඉහත සියල්ලෙහිම පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1301/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්තමාන රජයේ "දින 100" වැඩසටහනට සමගාමීව අයවැය යෝජනාවක් ලෙස රාජ්‍ය බැංකු වෙත උකස් කරනු ලැබූ රන් භාණ්ඩ නිදහස් කර ගැනීමේදී අයකරනු ලබන පොලී මුදල් කපාහරින බවට වූ පොරොන්දුවට අනුව 2015 සහ 2016 වර්ෂයන්හි රන් භාණ්ඩ නිදහස් කරගෙන ඇති මාතර දිස්ත්‍රික්කයේ ගනුදෙනුකරුවන් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඒ සඳහා වූ රජයේ සහනාධාරයේ මූල්‍ය අගය කවරේද;

(iii) ඉහත (ii) හි සඳහන් මුදල මාතර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක එක් එක් රාජ්‍ය බැංකුව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) වර්ෂ 2013 සිට 2016 දක්වා රන් පොලී අනුපාතය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය ජනාධිපතිවරණයේදී ප්‍රචාරක තේමාවක් බවට පත් කරගත් ස්වර්ණාභරණ උකස් කිරීම, හුදු ප්‍රචාරක ව්‍යාපෘතියකින් ඔබ්බට යාමක් සිදුවී නොමැති බව පිළිගන්නේද;

(ii) පොරොන්දු වූ පරිදි උකස් කරනු ලැබූ ස්වර්ණාභරණ නිදහස් කර ගැනීමේදී පොලී සහනයන් වහාම ලබා දීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1399/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 අයවැයෙහි අංක 171 යෝජනාවට අනුව, ග්‍රාමීය ආර්ථිකය නඟා සිටුවීමේ වැඩසටහන සඳහා, එක් ගමකට රුපියල් මිලියන 1.5 දක්වා, වෙන් කර දුන්, රුපියල් මිලියන 21,000ක ප්‍රතිපාදනය 2016 වර්ෂය තුළදී බෙදා දුන් ගම්මාන සහ එම එක් එක් ගම්මානයෙහි නිමකළ ව්‍යාපෘති පිළිබඳ සවිස්තරාත්මක ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(ii) එකී ග්‍රාමසේවක වසම් 14022හි උක්ත අයවැය යෝජනාව ක්‍රියාත්මක කළ බලධාරි ආයතන සහ එම බලධාරින් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් 2016 වසර තුළදී ලබාගෙන ඇති මුදල් ප්‍රමාණයන් දැක්වෙන ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(iii) උක්ත අයවැය යෝජනාවට අනුව, එක් ගමකට රුපියල් මිලියන 1.5 බැගින් වූ මූල්‍ය ප්‍රතිපාදන ලබා නොගත් හෝ ඉන් කොටසක් පමණක් ලබා ගත් ග්‍රාම නිලධාරි කොට්ඨාස ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර හා ජලජ සම්පත් (සංශෝධන),— 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

## යෝජනා පිළිබඳ දැනුම්දීම

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— විදේශගත ශ්‍රී ලාංකිකයන් හට ඉදිරි මැතිවරණවල දී ඡන්දය පාවිච්චි කිරීමට ඇති ඉඩකඩ සලසා දීමේ සහ ඊට ආනුෂංගික කරුණු විමර්ශනයකර වාර්තා කිරීම පිණිස වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— 2016 නොවැම්බර් මස 17 වැනි දින ගරු කථානායකතුමා විසින් පත්කරන ලද විදේශගත ශ්‍රී ලාංකිකයන් හට ඉදිරි මැතිවරණවලදී ඡන්දය පාවිච්චි කිරීමට ඇති ඉඩකඩ සලසා දීමේ සහ ඊට ආනුෂංගික කරුණු විමර්ශනයකර වාර්තා කිරීම පිණිස වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවට, තමන් විසින් නිරීක්ෂණය කරනු ලබන කරුණු, 2016 අප්‍රේල් මස 06 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මඟින් නියම කර ඇති කාලසීමාව ඇතුළත පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට නොහැකි බැවින්, එම කාරක සභාවට ලබා දී ඇති කාලසීමාව අංක 96 දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය ප්‍රකාරව 2017 නොවැම්බර් මස 23 වැනි දින දක්වා දීර්ඝ කළ යුතුය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

* 1.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 1),— 2015 අංක 16 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 32 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2015 අංක 16 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 32 දරන නියමය

මුදල් අමාත්‍ය, රවී කරුණානායක වන මම, 2015 අංක 16 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | <u>අයිතමය</u> | <u>සංශෝධනය</u> |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 4,000,000,000 සිට රු. 5,615,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2016.12.31 වැනි දින දක්වා පමණි)

රවී කරුණානායක, පා. ම.,
මුදල් අමාත්‍ය.

2017.04.07 වැනි දින,
කොළඹ.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 2),— 2015 අංක 16 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 33 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2015 අංක 16 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 33 දරන නියමය

මුදල් අමාත්‍ය, රවී කරුණානායක වන මම, 2015 අංක 16 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 22302 "ගබඩා අත්තිකාරම් ගිණුම (පුපුරණ ද්‍රව්‍ය) - ශ්‍රී ලංකා නාවික හමුදාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | <u>අයිතමය</u> | <u>සංශෝධනය</u> |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 400,000,000 සිට රු. 480,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 420,000,000 සිට රු. 450,000,000 දක්වා |

| | | | |
|---|---|---|---|
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 360,000,000 සිට රු. 390,000,000 දක්වා | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2016.12.31 වැනි දින දක්වා පමණි)

රවී කරුණානායක, පා. ම.,
මුදල් අමාත්‍ය.

2017.04.07 වැනි දින,
කොළඹ.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 3),— 2015 අංක 16 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 34 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2015 අංක 16 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 34 දරන නියමය

මුදල් අමාත්‍ය, රවී කරුණානායක වන මම, 2015 අංක 16 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 28502 "කෘෂිකාර්මික ගොවිපල නඩත්තුව හා බීජ අලෙවිය අත්තිකාරම් ගිණුම - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 525,000,000 සිට රු. 480,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2016.12.31 වැනි දින දක්වා පමණි)

රවී කරුණානායක, පා. ම.,
මුදල් අමාත්‍ය.

2017.04.07 වැනි දින,
කොළඹ.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 4),— 2015 අංක 16 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 35 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2015 අංක 16 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 35 දරන නියමය

මුදල් අමාත්‍ය, රවී කරුණානායක වන මම, 2015 අංක 16 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 30602 "දුම්රිය ගබඩා අත්තිකාරම් ගිණුම - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 1,800,000,000 සිට රු. 1,200,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2016.12.31 වැනි දින දක්වා පමණි)

රවී කරුණානායක, පා. ම.,
මුදල් අමාත්‍ය.

2017.04.07 වැනි දින,
කොළඹ.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 5),— 2015 අංක 16 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 36 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2015 අංක 16 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 36 දරන නියමය

මුදල් අමාත්‍ය, රවී කරුණානායක වන මම, 2015 අංක 16 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 31002 "රජයේ කර්මාන්ත ශාලාවේ ගබඩා අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| <u>අයිතමය</u> | | <u>සංශෝධනය</u> | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 150,000,000<br>රු. 80,000,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 150,000,000<br>රු. 80,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 40,000,000<br>රු. 65,000,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2016.12.31 වැනි දින දක්වා පමණි)

රවී කරුණානායක, පා. ම.,
මුදල් අමාත්‍ය.

2017.04.07 වැනි දින,
කොළඹ.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 6),— 2015 අංක 16 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 37 දරන නියමය අනුමත කළ යුතුයයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2015 අංක 16 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 37 දරන නියමය

මුදල් අමාත්‍ය, රවී කරුණානායක වන මම, 2015 අංක 16 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 31003 "රජයේ කර්මාන්ත ශාලාවේ කළවැඩ අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| <u>අයිතමය</u> | | <u>සංශෝධනය</u> | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 300,000,000<br>රු. 315,000,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත | |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2016.12.31 වැනි දින දක්වා පමණි)

රවී කරුණානායක, පා. ම.,
මුදල් අමාත්‍ය.

2017.04.07 වැනි දින,
කොළඹ.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 7),— 2015 අංක 16 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදන ලද මෙහි පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන් අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

(මෙම නියමයන් වලංගු වන්නේ 2016.12.31 වැනි දින දක්වා පමණි)

## උපලේඛනය

## 2015 අංක 16 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව කරන විධානය

2015 අංක 16 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ 2016 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් බලය දෙන සීමා වෙනස් කිරීමේ උපලේඛනය.

### කණ්ඩායම් විධාන අංක 01

2015 අංක 16 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතලවලට අනුව රවී කරුණානායක වන මම, මුදල් අමාත්‍යවරයා වශයෙන් ආණ්ඩුවේ අනුමතියට යටත්ව මේ සමඟ දක්වා ඇති උපලේඛනයේ දැක්වෙන ආකාරයට රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්වල විෂය අංක 00101, 00201, 00401, 10201, 10301, 11101, 11701, 11901, 12301, 12401, 13001, 16201, 19701, 19801, 21201, 22201, 22401, 22501, 22601, 23201, 24001, 24101, 24801, 28301, 28401, 29601, 30001, 30601, 32001, 33101 සහ 33201ට අදාළ වන්නා වූ පනතේ තෙවැනි උපලේඛනය තීරු අංක II සහ IV හි දක්වා ඇති උපරිම සීමාවන් සහ අංක III හි දක්වා ඇති අවම සීමාවන් සංශෝධනය කරමි.

| අනු අංකය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | විෂය අංකය | II රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව | | III රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමාව | | IV රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | නියෝග අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | සිට | දක්වා | සිට | දක්වා | |
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| 1 | අතිගරු ජනාධිපති | 00101 | 25,000,000 | 30,000,000 | - | - | - | - | 1 |
| 2 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 00201 | 10,000,000 | 14,000,000 | 6,000,000 | 7,000,000 | 36,000,000 | 38,000,000 | 2 |
| 3 | උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු | 00401 | - | - | 1,000,000 | 500,000 | - | - | 3 |
| 4 | මුදල් අමාත්‍යාංශය | 10201 | 16,000,000 | 19,000,000 | 9,500,000 | 10,500,000 | - | - | 4 |
| 5 | ආරක්ෂක අමාත්‍යාංශය | 10301 | 50,000,000 | 60,000,000 | 35,000,000 | 40,000,000 | - | - | 5 |
| 6 | සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 11101 | - | - | 1,100,000,000 | 1,065,000,000 | - | - | 6 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 7 | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය | 11701 | - | - | 10,000,000 | 8,000,000 | - | - | 7 |
| 8 | විදුලිබල හා පුනර්ජනනීය හා බලශක්ති අමාත්‍යාංශය | 11901 | 5,000,000 | 8,000,000 | 1,800,000 | 2,400,000 | - | - | 8 |
| 9 | නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය | 12301 | - | - | 7,000,000 | 4,000,000 | - | - | 9 |
| 10 | සමාජ සවිබල ගැන්වීම හා සුබසාධන අමාත්‍යාංශය | 12401 | - | - | - | - | 33,000,000 | 48,000,000 | 10 |
| 11 | රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශය | 13001 | - | - | 32,000,000 | 24,000,000 | - | - | 11 |
| 12 | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | 16201 | - | - | 4,000,000 | 3,500,000 | - | - | 12 |
| 13 | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 19701 | - | - | 12,000,000 | 9,000,000 | - | - | 13 |
| 14 | වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකරණ අමාත්‍යාංශය | 19801 | 4,000,000 | 8,500,000 | 1,000,000 | 6,000,000 | 20,000,000 | 31,000,000 | 14 |
| 15 | විභාග දෙපාර්තමේන්තුව | 21201 | 23,000,000 | 23,010,000 | - | - | - | - | 15 |
| 16 | ශ්‍රී ලංකා යුධ හමුදාව | 22201 | 2,500,000,000 | 2,750,000,000 | 2,450,000,000 | 2,700,000,000 | - | - | 16 |
| 17 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 22401 | - | - | 475,000,000 | 460,000,000 | - | - | 17 |
| 18 | පොලිස් දෙපාර්තමේන්තුව | 22501 | 1,900,000,000 | 1,200,000,000 | 1,450,000,000 | 1,350,000,000 | 4,000,000,000 | 2,000,000,000 | 18 |
| 19 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | 22601 | 33,000,000 | 36,000,000 | 32,000,000 | 29,000,000 | - | - | 19 |
| 20 | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | 23201 | - | - | 130,000,000 | 125,000,000 | - | - | 20 |
| 21 | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 24001 | 5,000,000 | 7,000,000 | 4,000,000 | 5,000,000 | - | - | 21 |
| 22 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | 24101 | 4,000,000 | 4,350,000 | 2,000,000 | 2,300,000 | - | - | 22 |
| 23 | සුරාබදු දෙපාර්තමේන්තුව | 24801 | 32,000,000 | 38,000,000 | 25,000,000 | 30,000,000 | 170,000,000 | 171,000,000 | 23 |
| 24 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 28301 | 50,000,000 | 69,000,000 | - | - | 251,000,000 | 281,000,000 | 24 |
| 25 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 28401 | 46,000,000 | 50,000,000 | 34,000,000 | 38,000,000 | 140,000,000 | 147,000,000 | 25 |
| 26 | ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව | 29601 | 5,000,000 | 5,126,196 | - | - | - | - | 26 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 27 | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | 30001 | - | - | 3,500,000 | 3,400,000 | - | - | 27 |
| 28 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 30601 | - | - | 350,000,000 | 300,000,000 | - | - | 28 |
| 29 | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | 32001 | 920,000,000 | 400,000,000 | 530,000,000 | 285,000,000 | - | - | 29 |
| 30 | දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව | 33101 | 600,000,000 | 300,000,000 | 300,000,000 | 225,000,000 | - | - | 30 |
| 31 | ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව | 33201 | - | - | - | - | 3,000,000 | 4,000,000 | 31 |
| | **එකතුව** | | **6,228,000,000** | **5,021,986,196** | **7,004,800,000** | **6,732,600,000** | **4,653,000,000** | **2,720,000,000** | |

රවී කරුණානායක, පා.ම,
මුදල් අමාත්‍ය.

2017.04.07

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

විදේශ විනිමය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා,— දිවිනැගුම පනත යටතේ නියෝග,— 2017 අංක 2 දරන පනතින් සංශෝධිත 2013 අංක 1 දරන දිවිනැගුම පනතේ 42 වගන්තිය යටතේ සහ එකී පනතේ 25(2) සහ 29(2) වගන්ති සමඟ කියවිය යුතු, 42 වගන්තිය යටතේ සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මාර්තු 07 දිනැති අංක 2009/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.05.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*10.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වැටුප් හා දීමනා ප්‍රතිශෝධනය කිරීම,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16(1) වගන්තිය මඟින් කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යයන් ඉටු කරලීම පිණිස එම කොමිෂන් සභාවට සහාය වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත්කිරීමට සහ එම තනතුර දරන තැනැත්තාට පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන වැටුපක් ගෙවීමට විධිවිධාන සලස්වා දී ඇති හෙයින්ද;

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට 2016.11.24 දින සිට නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල් ධූරයේ රාජකාරි කළ ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මහතා පත් කර ඇති හෙයින්ද;

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මහතාට පෞද්ගලික වන සේ අතිරේක සොලිසිටර් ජනරාල් තනතුරට හිමි මාසික වැටුප හා රජයේ නිල නිවාසයක් ලබා දී නොමැති නම්, නිවාස කුලී දීමනාව ඇතුළු සියලු දීමනා (දුරකථන දීමනාව සහ ඉන්ධන දීමනාව හැර) ලබාදීමටත්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධූරයට හිමි අමාත්‍යාංශ ලේකම් දීමනාව, දුරකථන දීමනාව සහ ඉන්ධන දීමනාව 2016.11.24 දින සිට ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද;

ඊට අනුකූලව, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මහතා වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනත් කෙටුම්පත — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2017 මාර්තු 08) [1].

*13.

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩා පනත යටතේ නියෝග,— 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වගන්තිය සමඟ කියවිය යුතු 41 වගන්තිය යටතේ ජාතික ක්‍රීඩා සංගම් සම්බන්ධයෙන් ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ඔක්තෝබර් 27 දිනැති අංක 1990/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ සහ 2017 පෙබරවාරි 13 දිනැති අංක 2006/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.04.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා,— වෙළඳ නැව් පනත යටතේ නියෝග,— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 321 වගන්තිය යටතේ බහාලුම් දළ ස්කන්ධ සත්‍යායන සම්බන්ධයෙන් වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 අගෝස්තු 11 දිනැති අංක 1979/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.02.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජුනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

21.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

22.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

23.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

24.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

25.
මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**
"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---